# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2162/57 – 2020 පෙබරවාරි 14 වැනි සිකුරාදා – 2020.02.14**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2020 අංක 08 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/5/2019/CEB/110.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: DSO/HOM/LAC/124.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2020 පෙබරවාරි මස 12 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
''මිහිකත මැදුර''
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී** – ප්‍රාදේශීය ලේකම්, හෝමාගම.

2. **ඉඩමේ විස්තරය.**– බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 590/ ඒ, මාගම්මන බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, මාගම්මන ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක CO/HMG/2019/388 හා 2019.08.26 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – අඹගහලන්ද, ඇටඹගහලන්ද සහ මොරගහලන්ද – ප්‍රමාණය: හෙක්. 0.0368 ක් පමණ**

උතුරට: සිමෙන්ති කාණුව සහ පී. ඒ. එස්. කුමාරතිලක හිමිකම් කියන අඹගහලන්ද, ඇටඹගහලන්ද සහ මොරගහලන්ද; නැගෙනහිරට: මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය); දකුණට: කැබලි අක්ෂර B; බටහිරට: කැබලි අක්ෂර B සහ සිමෙන්ති කාණුව.

02. **කැබලි අක්ෂර 'B' – අඹගහලන්ද, ඇටඹගහලන්ද සහ මොරගහලන්ද – ප්‍රමාණය: හෙක්. 0.0327 ක් පමණ**

උතුරට: සිමෙන්ති කාණුව, කැබලි අක්ෂර A සහ මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය); නැගෙනහිරට: කැබලි අක්ෂර A සහ මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය); දකුණට: මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) සහ කොතලාවල මාවත; බටහිරට: කොතලාවල මාවත සහ සිමෙන්ති කාණුව.

02 - 619


1A – G32032 – 21 (2020/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.


*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*